# ප්‍රචණ්ඩත්වයට මනුෂ්‍යත්වයේ දොර හැරදීම !

වේළුපිල්ලේ ප්‍රභාකරන් විසින් මොළ සෝදා, සිය ඊනියා විමුක්ති සටන සඳහා යොදා ගත් එල්. ටී. ටී. ඊ. සාමාජිකයන්ගෙන් පිරිසක් ඉදිරි දෙසතිය ඇතුළත ඔවුන්ගේ පවුල්වලට භාරදීම සඳහා රජය ක්‍රියා කරන බව සඳහන් පුවතක් "දිවයින" පෙරේදා (11 දා) වාර්තා කර තිබිණි. මේ සාමාජිකයන් අතර ගැහැනු, පිරිමි මෙන්ම ළමයි ද සිටිතියි වාර්තා වේ.

මෙම එල්. ටී. ටී. ඊ. සාමාජිකයන් අතර බහුතරය, ප්‍රභාකරන්ගේ ම්ලේච්ඡ හමුදා විසින් බලහත්කාරයෙන් එක් කර ගත් අය වෙති. එසේම පාසල් වයසේ සිටි දරු දැරියෝද මේ අතර වෙති. අපගේ වැටහීම නම් මේ සියලු සාමාජිකත්වයම ඊළාම් සිහිනය නමැති මිරිඟුව පෙන්වා ම්ලේච්ඡත්වයටම යොමු කරන ලද පිරිසක් බවය.

ප්‍රභාකරන් වෙනුවෙන් මිනිස් බෝම්බයක් බවට පත්වීමට මෙන්ම ඕනෑම සාහසික ක්‍රියාවකට ඉදිරිපත් වීමට මේ සාමාජිකයෝ පසුබට නොවූහ. තිස් අවුරුදු ත්‍රස්තවාදය මුළු රටම ගොදුරු කර ගැනීමට තරම් ප්‍රබල ව්‍යාපාරයක් ලෙස වර්ධනය වූයේ මෙම දෙමළ කොටි සාමාජිකයන් නිසා බවද පැහැදිලිය.

ප්‍රභාකරන් නන්දිකඩාල් කලපුවට පසු බැස සිය අපරාධවලට ජීවිතයෙන් වන්දි ගෙවූ අවස්ථාවේ සිට ඔහුගේ මෙම ජන ඝාතක හමුදාවලට යන එන මං නැති වූහ. සමහරු කොටි ඇඳුම් ගලවා සාමාන්‍ය මිනිසුන් හා ගැහැනුන් මෙන් හමුදාවට භාර වූහ. තවත් සමහරු සැඟවී ගියහයිද කියති. කුමක් වුවද මේ දහදහකට ආසන්න හෝ ඊට වැඩි කොටි හමුදාව සුමගට ගැනීමට රජය විශේෂ වැඩපිළිවෙළක් දියත් කළේය.

මිලින්ද මොරගොඩ ඇමැතිවරයාගේ මැදිහත්වීමෙන් සැකසුනු මෙම පුනරුත්ථාපන වැඩපිළිවෙළට වෙළෙඳ ප්‍රජාව ඇතුළු තවත් ස්වෙච්ඡා සංවිධානවලද අනුග්‍රහය ලැබී තිබිණි. ඉච්ඡාභංගත්වයට පැමිණි මෙම එල්. ටී. ටී. ඊ. සාමාජිකයන්ට යළිත් ජීවත්වීමේ අපේක්ෂාවක් දැල්වීමට පමණක් නොව, ඔවුන්ට සිය පවුල්වලට එක්ව නැ සියන් සමග අලුත් ජීවිතයක් ඇරඹීමටද මෙම ක්‍රියාදාමය හේතු වනු ඇත.

කොටි සංවිධානයේ ඉතිරිව සිටින සාමාජිකයන්ගෙන් සමහරුන්ට බරපතල චෝදනා තිබෙන බවද අපි දනිමු. මහා පරිමාණයේ ඝාතන ක්‍රියාවන්ට මෙන්ම බරපතල විනාශයන්ට දයක වූ පිරිස් හැර සාමාන්‍යයෙන් සටන් බිමේ සිටි අය තෝරා බේරා මෙබඳු අර්ථවත් වැඩපිළිවෙළක් මගින් ඔවුන්ට නිදහස දීමේ වරදක් අපට ද නොපෙනේ.

මෙම කොටි හමුදාවලට අයත් වූවෝද මේ රටේ උපන් අපගේම සහෝදර පිරිසක් වෙති. වර්ගවාදය නමැති විස ශරීර ගත කරන ලද මේ සාමාජිකයන් අතර ඉතා අහිංසක අයද සිටිති. එසේම ප්‍රභාකරන්ගේ ඊනියා ඊළමේ පාර්ශ්වකරුවන් ලෙස කැපවෙමින් ඝාතනය හා භීෂණය වපුල අයද සිටිති. අහිංසක ජනතාව කැති ගා දැමූ අධමයෝද සිටිති. එනිසා මෙම පිරිස් ඉතා සැළකිල්ලෙන් තෝරා බේරා ගෙන යළි සමාජ ගත කිරීමටද වගබලා ගත යුතුය.

බරපතල අපරාධ නොකළ හා ප්‍රචණ්ඩත්වය අත්හැර යහමගට ඒමට කැමති පිරිස් තවදුරටත් අත්අඩංගුවේ රඳවා සිටීමද ඒ අයගේ පසුතැවිල්ල වඩන්නක් විය හැකිය. තමන් විසින් කරන ලද වරද වරදක් ලෙස පිළිගන්නා අයෙකුට එයින් මිදෙන මගක් තිබීමද වැදගත්ය. එනිසා මෙම පිරිස් නිදහස් කිරීමේදී හැම අංශයක්ම සලකා බලා ඔවුන් සමාජයට එකතු කිරීම යහපත් පියවරක් ලෙස අපි ද දකිමු.

වේළුපිල්ලේ ප්‍රභාකරන් යනු දෙමළ බෙදුම්වාදයේ එක් හිසක් පමණක් බව අපි මෙම තීරුව මගින් බොහෝ විට කියා ඇත්තෙමු. ඒ හිස නසා දමා තිබුණත් එම කවන්ධයට සවි කිරීමට හිසක් සොයන බවද අපගේ අදහස ය. ඒ තුච්ඡ ව්‍යාපාරය අඩපණ කිරීම සඳහාද මෙලෙස එල්ටීටීඊ සාමාජිකයන් තෝරා බේරා ආපසු සමාජ ජීවිතයකට යොමු කිරීම ඉතා ප්‍රායෝගික බව අපි හිතමු.

මේ සාමාජිකයන්ගේ පවුල්වලටද දිගු කලකට පසු සතුටු සිනහවක්, අස්වැසිල්ලක් ලබා දීමටද මේ පියවර හේතු වනු ඇත. තම පවුලෙන් පිටමංව වනගතව, සැහැසි ප්‍රචණ්ඩ ජීවිත ගෙවූ තම සාමාජිකයා ආපසු ගෙදර ඒම තරම් වාසනාවක් ඔවුනට තිබේද? සත්තකින්ම එය ප්‍රචණ්ඩත්වය ලුහුබැඳ ගිය අයට මනුෂ්‍යත්වයේ දොර හැර දීමකි.